00134

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 3 මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II - 2022/2023
LLU3604 – ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය I
කාලය - පැය 1

---

දිනය : 22.10.2023

වේලාව: ප.ව. 01.30 – ප.ව. 02.30

---

එක් ප්‍රශ්නයකට පමණක් (01) පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. අදාළ නීති අධිකාරීන් ඇසුරෙන් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

   අ) ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ස්වස්ථානිකභාවය පිළිබඳ මූලධර්මය පහදන්න.

   (ලකුණු 06)

   ආ) ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කැපී පෙනෙන ලක්ෂණ පිළිබඳව සාකච්ඡා කරන්න.

   (ලකුණු 06)

   ඇ) ශ්‍රී ලංකාවේ ප්‍රථම සහ දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් තුළ මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පිළිගැනීම සසඳන්න.

   (ලකුණු 08)

   (ලකුණු 06+06+08 = 20)

2. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. අදාළ නීති අධිකාරීන් ඇසුරෙන් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

   අ) බලතල බෙදීමේ න්‍යාය කෙරෙහි මොන්ටෙස්කියුගේ දායකත්වය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින්, පැහැදිලි කරන්න.

   (ලකුණු 06)

   ආ) 1787 එක්සත් ජනපද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යවස්ථාමය ප්‍රතිපාදන ඇසුරෙන් සංවරණ සහ තුලන න්‍යාය පිළිබඳව විශ්ලේෂණය කරන්න.

   (ලකුණු 06)

   ඇ) එක්සත් රාජධානිය තුළ බලතල බෙදීමේ න්‍යාය කෙරෙහි 1998 මානව හිමිකම් පනත සහ 2005 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත මගින් සිදුකර ඇති බලපෑම සාකච්ඡා කරන්න.

   (ලකුණු 08)

   (ලකුණු 06+06+08 = 20)

*හිමිකම් ඇවිරිණි.*